# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1807/23 – 2013 අප්‍රේල් 26 වැනි සිකුරාදා – 2013.04.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 114 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/4/2013/ඩී/96.
යාපනය දිස්ත්‍රික් අත්කර ගැනීමේ නිලධාරී
යොමු අංකය: එල්ඩීඩී/ඩීම්(i)/එල්ජී/පීජීඑල්/01.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 අප්‍රේල් මස 24 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– යාපනය දිස්ත්‍රික්කය.

2. **ඉඩමේ විස්තරය.**– උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් උතුර හා වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි, කන්කසන්තුරේ බටහිර, කන්කසන්තුරේ මධ්‍යම, විමන්කාමම් දකුණ, තෛයිඩ්ඩි දකුණ, පලාලි දකුණ, ඔට්ටපුලම් හා වලාලි යන ගම්වල පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක යා/ටීඑල්එල්/2013/111 හා 2013.04.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 සිට 72 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්. 2578.4475 (අක්. 6371 රූ. 1 පර්. 15)ක් වූ ඉඩම් කැබැල්ලට මායිම්:

උතුරට: ඉන්දියන් සාගරය; නැගෙනහිරට සහ දකුණට: පස් බැම්ම; බටහිරට: වරාය අධිකාරිය සතු ඉඩම, සිමෙන්ති සංස්ථාව සතු ඉඩම හා පස් බැම්ම.

05 - 271

1A – G 17582 – 370 (2013/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*